# ස්ථිර පවුල් සැලසුම් ක්‍රම

## ස්ත්‍රී පවුල් සැලසුම් ස්ථිර සැත්කම

උදරයේ පහළ කොටසෙහි ඉතා කුඩා කැපුමක් තුළින් පැලෝපීය නාල අවහිර කරනු ලැබේ

### වාසි

- ස්ථිර ක්‍රමයක් වන බැවින් පවුල් සැලසුම් ක්‍රම ගැන නැවත නැවත සිතීම අවශ්‍ය නොවේ

### අවාසි

- ස්ථිර පවුල් සැලසුම් ක්‍රමයක් වන බැවින් නැවත දරුඵල ලබා ගැනීමට නොහැකිය

### සාර්ථකත්වය

- 99.5% කි

## පුරුෂ පවුල් සැලසුම් ස්ථිර සැත්කම (වාසෙක්ටමි)

වෘෂණවල සිට ශුක්‍රාණු ගෙන යන ශුක්‍ර නාල අවහිර කිරීම මඟින් සිදු කරන ස්ථිර පවුල් සැලසුම් ක්‍රමයකි

### වාසි

- ස්ථිර ක්‍රමයක් බැවින් පවුල් සැලසුම් ක්‍රම ගැන නැවත නැවත සිතීම අවශ්‍ය නොවේ
- මෙය සුළු සැත්කමක් වන නිසා දෛනික ජීවිතයේදී බාධාවක් ඇති නොවේ

### අවාසි

- සැත්කමින් පසු මාස 3 ක පමණ කාලයක් වෙනත් ක්‍රමයක් භාවිතා කළ යුතුය

  උදා: රබර් කොපු, නික්ෂේපණය, ගිලින පෙති
- ස්ථිර පවුල් සැලසුම් ක්‍රමයක් වන බැවින් නැවත දරුඵල ලබා ගැනීමට නොහැකිය

### සාර්ථකත්වය

- 99.9% කි

# පුරුෂ තාවකාලික පවුල් සැලසුම් ක්‍රම

## රබර් කොපුව (කොන්ඩමය)



පුරුෂයාගේ ශිෂ්ණය සම්පූර්ණයෙන් වැසෙන සේ පළඳින තුනී රබර් කොපුවකි

### වාසි

- දරුඵල නැවත ලබා ගැනීමේ ප්‍රමාදයක් නැත
- ඒඩ්ස් ඇතුළු ලිංගාශ්‍රිතව බෝවන රෝග ද වළක්වා ගැනීමට උපකාර වේ

### අවාසි

- නිසි ලෙස භාවිතා නොකළහොත් ගැබ් ගැනීමකට සැලකිය යුතු අවදානමක් ඇත

### සාර්ථකත්වය

- නිවැරදි භාවිතයේ දී 98% කි

## වැඩිදුර උපදෙස් සඳහා හමුවන්න

- සෞඛ්‍ය වෛද්‍ය නිළධාරීන්
- වෛද්‍ය නිළධාරීන්
- ලියාපදිංචි වෛද්‍ය නිළධාරීන්
- මහජන සෞඛ්‍ය හෙද සොහොයුරියන්
- පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනියන්
- මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්

**සුවසැරිය ✆ 1999**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ, පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ
සහ සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ ප්‍රකාශනයකි

නිසි කල රිසි ලෙස
දරු සම්පත


**ප්‍රීතිමත්**
**යුග දිවියක් උදෙසා...**



# පවුල් සැලසුම් ක්‍රම

# කාන්තාවන් සඳහා තාවකාලික පවුල් සැලසුම් ක්‍රම

## අන්තඃ ගර්භාෂ තැන්පතුව



ස්ත්‍රියකගේ ගර්භාෂයේ තැන්පත් කරන T හැඩති තඹ අඩංගු කුඩා ප්ලාස්ටික් නිපැයුමකි

### වාසි

- දිගු කාලයක් එනම් අවු. 10 ක් දක්වා අනවශ්‍ය ගැබ් ගැනීම් වළක්වයි
- දරුවකු අවශ්‍ය වූ ඕනෑම අවස්ථාවක දී මෙය ඉවත් කරවා ගැනීමෙන් පසු, දරුඵල නැවත ලබා ගැනීමට ප්‍රමාදයක් ඇති නොවේ

### සාර්ථකත්වය

- නිවැරදි භාවිතයේ දී 99.4% කි

## ගිලින පෙති



ස්ත්‍රී හෝමෝන (ඊස්ට්‍රජන් සහ ප්‍රොජෙස්ටරෝන්) වලට සමාන සංයෝග අඩංගු දිනපතා ගත යුතු ගිලින පෙති වර්ගයකි

### වාසි

- දරුවකු අවශ්‍ය වූ ඕනෑම අවස්ථාවක දී පෙති ගැනීම නතර කිරීමෙන් පසු දරුඵල නැවත ලබා ගැනීමට ප්‍රමාදයක් ඇති නොවේ
- අක්‍රමවත් ඔසප් චක්‍ර ක්‍රමවත් කිරීමට උපකාරී වේ

### අවාසි

- දිනපතා නොගැනීම නිසා ගැබ් ගැනීමක් සිදුවිය හැකිය

### සාර්ථකත්වය

- නිවැරදි භාවිතයේ දී 99.7% කි

## නික්ෂේපණය (DMPA)



ප්‍රොජෙස්ටජන් නම් ස්ත්‍රී හෝමෝනයට සමාන සංයෝගයක් අඩංගු නික්ෂේපණයකි

### වාසි

- මෙම නික්ෂේපණය ලබාගත යුත්තේ මාස 3කට වරකි

### අවාසි

- නැවත ගැබ්ගැනීම සඳහා නික්ෂේපණය නැවැත්වීමෙන් පසු අනෙකුත් ක්‍රම වලට සාපේක්ෂව මාස 4 ක පමණ කාලයක් ගත විය හැකිය

### සාර්ථකත්වය

- නිවැරදි භාවිතයේ දී 99.8% කි

## හෝමෝන කරල් තැන්පතුව



- ස්ත්‍රියකගේ උඩු බාහුවේ තැන්පත් කරන කරල් විශේෂයකි
- ප්‍රොජෙස්ටජන් නම් ස්ත්‍රී හෝමෝනයට සමාන සංයෝගයක් අඩංගු වේ

### වාසි

- දිගු කාලයක් (කරල් 2 තැන්පතුවක් නම් වසර 5ක් දක්වාද, කරල් 1 තැන්පතුවක් නම් වසර 3ක් දක්වාද) අනවශ්‍ය ගැබ් ගැනීම් වලින් වළක්වයි
- දරුවකු අවශ්‍ය වූ ඕනෑම අවස්ථාවකදී කරල් ඉවත් කරවා ගැනීමෙන් පසු දරුඵල නැවත ලබා ගැනීමට ප්‍රමාදයක් ඇති නොවේ

### අවාසි

- ඇතැම් අවස්ථාවල ඔසප් වීමේ අක්‍රමිකතා ඇතිවිය හැක

### සාර්ථකත්වය

- නිවැරදි භාවිතයේ දී 99.9% කි



බලාපොරොත්තු නොවූ ලිංගික ඇසුරකදී හදිසි පවුල් සැලසුම් ක්‍රමයක් ලෙස අන්තඃ ගර්භාෂ තැන්පතුව හෝ පසු සංවාස හදිසි පෙති ලබා ගත හැකිය.